# 1 පංච පුස්තකය

ගුරුතුමා : ළමයි, අද මම ඔයාලට වැදගත් පාඩමක් උගන්වන්න අදාළ වන පොතක් ගෙනාවා. හැබැයි මේක වෙළුමක්, පොත් පහක එකතුවක්. ලෝකයේ නැත්නම් විශ්වයේ ආරම්භය, මිනිසා මවනු ලැබීම හා ඔහු පාපයට වැටීම විතරක් නෙවෙයි; දෙවියන් වහන්සේ ආදිපිතෘවරුන් තෝරා පත් කර ගැනීම, ඉශ්‍රායෙල්වරුන් ඊජිප්තුවේ වහල්භාවයට පත්වීම හා මෝසෙස් තුමාගේ නායකත්වය යටතේ ඔවුන් පොරොන්දු දේශය කරා ගෙන යාම ආදී ලස්සන කථා පුවත් මෙහි ඇතුළත් වෙනවා. විශ්වය මැවීම හා මිනිසා පාපයට වැටීම පැරණි කථාන්තර ආකාරයට කියන නිසා ඒවායේ සත්‍ය අසත්‍යතාව සොයනවාට වඩා ඒවායින් ගත හැකි දේවධාර්මික පණිවිඩ තමයි අපට වැදගත් වෙන්නේ.

මාරි : අපි හරි ආසයි, ඒ ගැන දැන ගන්න, ටීචර්.

ගුරුතුමා : හොඳයි, ඔයාලගේ ම යහළුවන් පස්දෙනෙක් සූදානම් වෙලා ඉන්නවා ඒ පිළිබඳ ව ඔයාල ව දැනුවත් කරන්න.

නොයෙල් : මම තමයි, උත්පත්ති පොත. විශ්වයේ හා මිනිසාගේ ආරම්භය පිළිබඳ ව මම යි වාර්තා කරන්නේ. මට කියන්න උවමනා විශ්වය මැවූ හැටි නොවේ. දෙවියන් වහන්සේ විශ්වයේ මැවුම්කරුවාණන් කියන එක යි. හැබැයි මගේ පණිවිඩය නම් සර්වකාලීන යි.

රයන් : මට තමයි නික්මයාම පොත කියන්නේ. දෙවියන් වහන්සේ තෝරාගත් ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල් බැම්මෙන් මුදා පොරොන්දු දේශය කරා ගෙන යාම ගැන කථා කරන්නේ මම යි. මේක ඉතාමත් ලස්සන සිදුවීමක්. මගේ අත්දැකීම් මත තමයි මුළු පංච පුස්තකය ම නිර්මාණය වෙලා තියෙන්නේ.

බ්‍රයන් : මම තමයි ලෙවී ව්‍යවස්ථාව. පුරාණ ගිවිසුමෙහි ජනවන්දනාවට අදළ නීති නියෝග පිළිබඳ ව මම තමයි කරුණු ගෙනෙන්නේ.


කෙවින් : මම ගණන් කථාව. ඉශ්‍රායෙල් ජනතාවගේ කාන්තාර ගමන ගැන මම යි ලියන්නේ. ඒක බොහොම දුෂ්කර, දේව අත්දැකීම්වලින් පිරුණු ගමනක්.

ෂෙරීන් : මට තමයි ද්විතීය නීති සංග්‍රහය කියලා කියන්නේ. දෙවියන් වහන්සේට පක්ෂපාත වෙලා ඔවුන් වහන්සේගේ වචන අනුව ජීවත් විය යුතු යි කියලා මම යි දැනුවත් කරන්නේ. එහෙම කරන හැම දෙනාට ම දේවාශිර්වාදය ලැබෙනවා.

ගුරුතුමා : බොහොම හොඳයි. ඒ දැනුවත් වීමත් එක්ක අපි පාඩම පටන් ගනිමු.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ශුද්ධ බයිබලයෙහි මුල් පොත් පහ වන්නේ උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව සහ ද්විතීය නීති සංග්‍රහය වේ. ඒවා "පංච පුස්තකය" යනුවෙන් හැඳින්වේ. මෙම පොත් හැඳින්වීම සඳහා හෙබ්‍රෙව් භාෂාවෙන් "ටෝරා" යන වචනය භාවිත වේ. එහි අර්ථය, "ව්‍යවස්ථාව" නැතහොත් "ඉගැන්වීම" යි. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් ලෙස නීතිය, ව්‍යවස්ථාවලිය, මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව යනාදිය ගෙන හැර දැක්විය හැකි ය. පංච පුස්තකය සකස් වී ඇත්තේ පරම්පරාගත විශ්වාස හා අත්දැකීම් පදනම් කර ගෙන ය. පංච පුස්තකය රචනා වීම සඳහා ප්‍රධාන දේවධාර්මික සම්ප්‍රදායයන් හතරක් දායක වී ඇති බව ශුද්ධ ලියවිලි විශාරදයන්ගේ පිළිගැනීම යි. ඒවා නම් යාවේ (J), එලොහිම් (E), ද්විතීය නීති (D) හා පූජක (P) වේ.


1.1 රූපය - පංච පුස්තකය

### යාවේ සම්ප්‍රදාය (J)

මෙම සම්ප්‍රදය දෙවියන් වහන්සේ සඳහා භාවිත කළ නාමය, "යාවේ" (ස්වාමින් වහන්සේ) වේ. මේ සම්ප්‍රදායයෙහි යොදා ගන්නා සාහිත්‍යමය (භාෂා) ශෛලිය කතාන්දර ස්වරූපයක් ගන්නා අතර සරල ය; පැහැදිලි ය; විවිධත්වයකින් හා නාට්‍යමය ලක්ෂණවලින් යුක්ත ය. චිත්තරූප මවා ගැනීමට ඉඩ සලසයි. මෙම සම්ප්‍රදායයට අයත් කථා ලෙස;

- මැවීම පිළිබඳ දෙවන කථාව (උත්පත්ති 2:4ආ-25)
- ආදම් හා ඒව පාපයට වැටීම (උත්පත්ති 3)
- කායින් හා ආබෙල් (උත්පත්ති 4)

දැක්විය හැකි ය. දෙවියන් වහන්සේ මිනිසාට ඉතා සමීප සම්බන්ධතාවක් දක් වූ බව මානවරූපී ශෛලියකින් මෙම සම්ප්‍රදාය අවධාරණය කරයි. උදාහරණ:- "දෙවි සමිඳාණන් වහන්සේ මිනිසාට හඬ ගසමින් නුඹ කොහේ දැ'යි ඇසූ සේක" (උත්පත්ති 3:9). අපි ද දෙවියන් වහන්සේ සමග සමීප වී දේව ආදරය අත්දැකිය යුතු වෙමු.

### එලොහිම් සම්ප්‍රදාය (E)

මෙම සම්ප්‍රදය දෙවියන් වහන්සේ ව හඳුන්වනු ලබන්නේ, "එලොහිම්" යන නමිනි. දෙවියන් වහන්සේ ව ඉදිරිපත් කරන්නේ මිනිසාට වඩා උසස්, උත්කෘෂ්ට තැනැත්තකු ලෙස ය. උදාහරණ :- "මෙතනට ළං නොවන්න. ...... නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියකි"යි මෝසෙස් තුමාට දැනුම් දෙයි (නික්මයාම 3:5). උන්වහන්සේ මිනිසාට කථා කරනුයේ දර්ශන, සිහින දේව දූතයන් ආදි මාර්ග වලිනි. මෙහි සාහිත්‍යමය ශෛලිය ඍජු ය; කෙටි ය; විස්තරාත්මක නොවේ. මෙම සම්ප්‍රදායයට අයත් සිදුවීම් ලෙස:

- ඊසාක් පූජා කිරීම (උත්පත්ති 22:1-19)
- ජාකොබ් තුමා බෙතෙල්හි දුටු දර්ශනය (උත්පත්ති 28:10-20) දැක්විය හැකි ය.


නොමිලේ බෙදහැරීම සඳහා ය.

දෙවියන් වහන්සේ එදිනෙදා ජීවිතයේ දී විවිධ මාර්ගවලින් අපට ද කථා කරන සේක. උන්වහන්සේගේ හඬට සවන් දීමට අපි පුරුදු පුහුණු විය යුතු වෙමු.

## ද්විතීය නීති සම්ප්‍රදාය (D)

භාෂා ශෛලිය අනුශාසනාත්මක ය. මෙම සම්ප්‍රදය ද්විතීය නීති සංග්‍රහය නමැති පොතට පමණක් සීමා වේ. දෙවියන් වහන්සේ සමග කළ ගිවිසුමට විශ්වාසවන්ත ව ජීවත් වෙමින් එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බවට උපදෙස් දෙයි (ද්විතිය නීති 6:4-6). අපිත් සැබෑ වූ එක ම දෙවි පියාණන් වහන්සේට පමණක් අපගේ වන්දනාව හා ගෞරවය හිමි කර දිය යුතු වෙමු (උදාහරණ: දස පනත - ද්විතිය නීති 5:7-21).

## පූජක සම්ප්‍රදාය (P)

දෙවියන් වහන්සේ ඉදිරිපත් කර ඇත්තේ, අතිඋත්කෘෂ්ට තැනැන්වහන්සේ කෙනෙක් ලෙස ය. පූජකවරුන්ගේ ඉගැන්වීම් ඉදිරිපත් කරන බැවින් ආගමික වතාවත් හා ජනවන්දනාව පිළිබඳ ව විශේෂ අවධානයක් දී ඇත. මෙම සම්ප්‍රදායයට අදාළ සිද්ධි ලෙස;

- මැවීම පිළිබඳ පළමු කථාව (උත්පත්ති 1:1-2:4අ)
- නෝවා සමග ගිවිසුම (උත්පත්ති 9:1-17) දැක්විය හැකි ය.

දෙවියන් වහන්සේ ලෝකය දින හයකින් මවා හත්වන දින නිවාඩු ගත් හෙයින් එදින (සබත් දින) ශුද්ධ ලෙස ගත කිරීම පිළිබඳ ව අවධාරණය කරයි. දෙවියන් වහන්සේ සඳහා කැප වූ ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීමට අපිත් උත්සාහ කරමු.

## පංච පුස්තකයෙහි ඇති වැදගත්කම

දේව ධාර්මික තේමා රාශියකින් පෝෂණය වූ පංච පුස්තකය මැවුම්කරුවාණන් සහ මිදුම්කරුවාණන් වන දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම ඉශ්‍රායෙල්වරුන්ගේ මෙන් ම අපගේ වගකීම බව පහදා දෙයි. දෙවියන් වහන්සේගේ ආදරය හා කරුණාව හේතු කොට ගෙන විශ්වයේ ගැලවීම සඳහා තෝරා ගත් ජාතිය වූයේ ඉශ්‍රායෙල්වරුන් ය. ඔවුන් වහල්භාවයට පත් වූ විට ඔවුන් ගලවා ගෙන පොරොන්දු දේශය කරා ගෙන යාම ආදිපිතෘවරුන්ට දුන් පොරොන්දු ඉටු වීමකි. උන්වහන්සේගේ නීතිය මගින් දුබල මිනිසා හික්ම වන අතර උන්වහන්සේට පක්ෂපාත වීම තුළ දේවාශිර්වාදයට පංගුකාරයන් වන බව පසක් කර දෙයි. මැවුම්කාර දෙවි පියාණන් වහන්සේගේ අණපනත් පිළිපදිමින් දේවාශිර්වාදයට අපි සැම දෙනා පංගුකාරයන් විය යුතු වෙමු.

### ක්‍රියාකාරකම

1. පංච පුස්තකය ලියැවීමට පසුබිම් වූ දේවධාර්මික සම්ප්‍රදායයන් **හතර** නම් කරන්න.
2. එක් එක් සම්ප්‍රදයයෙහි ඉගැන්වීම් අනුව ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශය බැගින් ලියන්න.
3. පංච පුස්තකයෙහි වැදගත්කම පිළිබඳ ව වාක්‍යය **තුනක්** ලියන්න.
4. පංච පුස්තකය අධ්‍යයනයෙන් ඔබේ ජීවිතයට ලැබෙන ප්‍රයෝජන **පහක්** ලියන්න.

### ජීවිතයට බිඳක්



- *විශ්වයේ මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරමු.*
- *අපට අදරැති දෙවි පියාණන්ට ප්‍රතිප්‍රේමය දක්වමු.*
- *දෙවි පියාණන් වහන්සේ අපගේ ජීවිතවලට සමීප බව අත්දකිමු.*
- *ඉරුදින ශුද්ධ ලෙස ගත කරමු.*